

**Hotline - 0113 071794**


**Contact Details**
**Sri Lanka Foundation Institute**
**Education Services Unit**
**No 100, Sri Lanka Padanama Mawatha,**
**Independence Square, Colombo 07**

**Coordinator / Senior Lecturer**
**Ms Pramoda Sarojini - Ext 281**
**0714 539 484 (Wed 8.00 - 4.00)**

**Education Service Unit**
**0112691814 / 0112695249 - Kumuduni / Piyumi**
**0112 684512 - Naduni**
**Fax: 011 2691028 / edu@slf.lk**


**Online Registration**
**& Application Download www.slf.lk**

like us on facebook www.facebook.com/srilankafoundation

SLF
ශ්‍රී ලංකා පදනම
இலங்கை மன்றம்
Sri Lanka Foundation

## ශ්‍රී ලංකා පදනම් ආයතනය

ශ්‍රී ලංකා පදනමේ අධ්‍යාපන ව්‍යාපෘතියකි

# ව්‍යවහාරික අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති ක්‍රමය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව 2020




**Rs. 55,400/- 01 Year**

Application closing date April 30th 2020

***SLFI - YOUR EDUCATION SERVICE PARTNER***

## හැඳින්වීම

වර්තමාන සමාජයේ අපරාධ හා අපරාධ යුක්තිය පසිඳලීමේ ආයතන කෙරෙහි වඩාත් පුළුල් අවධානයක් යොමු වී තිබේ. ගෝලියකරණය හා ජාත්‍යන්තරකරණයේ ප්‍රතිඵල වශයෙන් විශ්විය වශයෙන් ව්‍යාප්ත වන අපරාධ පාලනය හා මර්දනය කිරීම ඉතා සූක්ෂ්ම ක්‍රියාවලියක් බවට පත්ව තිබේ.

අපරාධ විද්‍යාව පිළිබඳ සූක්ෂ්ම දැනුමක් හා පුහුණුවක් ලබා තිබීම අපරාධ මර්දනයෙහිලා අත්‍යවශ්‍ය ය. ඒ සඳහා සැළසුම් කොට ඇති මෙම පාඨමාලාව අපරාධ හා අපරාධ යුක්තිය පිළිබඳ සංකල්පිය, විචාරාත්මක හා ව්‍යවහාරික දැනුමක් හා කුසලතාවක් ලබා දීම අරමුණු කොට ගෙන සැළසුම් කොට ඇත.

ව්‍යවහාරික විෂයයක් වශයෙන් වෘත්තීය හා ප්‍රායෝගික දැනුම හා පුහුණුව ලබා දීම විශේෂ කොට ගෙන පාඨමාලා-වේ විෂය නිර්දේශය සකස් කොට ඇත. සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, මනෝවිද්‍යාව, අධිකරණ විද්‍යාව හා නීතිය ආදී සමාජීය විද්‍යා විෂයන්වල අන්තර් විෂයයීක විෂයක් වශයෙන් හැදෑරීමට පාඨමාලාවේ අන්තර්ගතය පුළුල් කර ඇත.

මෙම පාඨමාලාව වෘත්තිය හා අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් අපරාධ වැළැක්වීම, සමාජ සුභසාධනය, පරිවාස, පොලිසිය, බන්ධනාගාර හා අපරාධ විනිශ්චය හා යුක්තිය ඉටු කරන ක්ෂේත්‍රවල සේවයේ නියුතු අයගේ වෘත්තීය සංවර්ධනය හා සේවා අභියෝග ජය ගැනිම සඳහා ද යෝග්‍යය වේ.

## පාඨමාලාවේ අරමුණු

01 නීතිමය ක්ෂේත්‍රය තුළ රාජකාරි කටයුතු සිදුකරනු ලබන නිළධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමෙන් ජනතාවට වඩාත් වැදගත් සේවාවක් සැපයිම සඳහා හැකියාව ලබා දීම

02 සමාජයේ සංවර්ධනයට හා කාර්යක්ෂම සමාජ පාලනයක් ඇති කිරිම සඳහා දායක වීම

03 ගෝලීය හා දේශීය සංදර්භය තුළ අපරාධ හා යුක්තිය පිළිබඳ ගවේෂණය කිරීමට හැකියාව ලබා දිම

04 අපරාධ හා යුක්තිය පසිඳලීමේ දි ඇතිවන අභියෝගාත්මක ගැටලු සමඟ ගණුදෙණු කිරිමේ හැකියාව ලබා දීම

05 නීතිය බලාත්මක කරන ආයතන හා නිළධාරීන්ගේ වෘත්තිය සංවර්ධනය තුළින් වෘත්තීය සාර්ථකත්වයක් කරා යොමු වීමට හැකියාව ලබා දීම

## අපේක්ෂිත කණ්ඩායම

අපරාධ හා අපරාධ යුක්තිය හා සම්බන්ධ ක්ෂේත්‍රයේ සේවය කරන සියලු වෘත්තිකයන් සහ අපරාධ යුක්ති ක්‍රමය පිළිබඳ හැදෑරීමට කැමැත්තක් දක්වන ඕනෑම අයෙක් සඳහා අදාළ වේ.

## සම්පත්දායකත්වය

අපරාධ විද්‍යා ක්ෂේත්‍රයේ නියැලි ප්‍රවීන අධ්‍යාපනඥයින් සහ වෘත්තිකයින් විසින් ලබා දෙනු ලැබේ.

## මොඩියුල

CRIM 21142 අපරාධ විද්‍යාව හා ව්‍යවහාරික අපරාධ විද්‍යාව හැඳින්වීම
CRIM 21242 අපරාධ විද්‍යා න්‍යාය
CRIM 21342 අපරාධ යුක්ති ක්‍රමය
CRIM 21442 මනෝවිද්‍යාව, සමාජ මනෝවිද්‍යාව සහ අපරාධ
CRIM 21542 අපරාධ පාලනය හා වැලැක්වීම, පුනරුත්ථාපනය සහ සමාජගත කිරිම
CRIM 22142 අපරාධ නීතිය හා මානව හිමිකම්
CRIM 22242 අපරාධ විමර්ශනය සහ අධිකරණ විද්‍යාව
CRIM 22342 උපදේශනය සහ ගැටුම් සමථකරණය
CRIM 22442 අපරාධවිද්‍යා පර්යේෂණ ක්‍රමවේද
CRIM 22549 ස්වාධීන පර්යේෂණය

ඩිප්ලෝමාව සමත්වීම සඳහා මෙම මොඩියුල සියල්ලම හැදෑරීම අනිවාර්ය වේ. පාඨමාලාව අවසානයේ ක්ෂේත්‍ර පර්යේෂණයක් කොට ඒ පිළිබඳ ව්‍යාපෘති වාර්තාවක් සැපයිය යුතුය. දැනුම ලබාගැනීම සඳහා ශිෂ්‍යයන්, අධ්‍යයන පැවරුම් සහ ක්ෂේත්‍ර චාරිකාවල යෙදිය යුතු අතර ආරාධිත දේශනවලට ද සහභාගි විය යුතුය.

## පාඨමාලාව හැදෑරීමෙන් ඔබට

- ශ්‍රී ලංකාවේ අපරාධවල ස්වභාවය හා වර්ගිකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක අවබෝධයක් ලැබේ
- ගෝලීය හා ජාතික වශයෙන් අපරාධ වර්ධනය වීමට බලපාන හේතු හඳුනා ගත හැකිවේ
- ගෝලීය හා ජාතික වශයෙන් අපරාධ යුක්ති ක්‍රම හා එහි ප්‍රායෝගිකත්වය පිළිබඳව හඳුනා ගැනීමට හැකිවේ

**පාඨමාලා ගාස්තුවට උදේ සවස තේ, ලිපි ද්‍රව්‍ය, අත් පත්‍රිකා, සහතික පත්‍රය ඇතුලුව ප්‍රවීන සම්පත්දායකත්වය යටතේ වායු සමීකරණය කරන ලද දේශන ශාලා පහසුකම් ඇතුලත් වේ.**

**මෙම පාඨමාලාව අවසානයේ මැලේසියාවේ විවෘත විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන අපරාධ පාලනය හා වැලැක්වීම පිළිබඳ පුහුණු වැඩසටහනට ද අවශ්‍ය නම් සහභාගී විය හැකිය.**